C

# නිවේදනය

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව අනුව ශ්‍රේෂ්ඨාධිකරණය හමුවේ අභියෝගයට ලක් කරන ලද "මානව හිමිකම් සංවිධානය (සංස්ථාගත කිරීමේ)" නමැති පෞද්ගලික මන්ත්‍රී පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැන්වීමට කැමැත්තෙමි.

පනත් කෙටුම්පත ශ්‍රේෂ්ඨාධිකරණය විසින් පරීක්ෂා කර, පනත් කෙටුම්පතෙහි 6 වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 76(1) ව්‍යවස්ථාවට අනනුකූල වන බවත්, පනත් කෙටුම්පතෙහි 7වගන්තිය ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 3, 4 සහ 12(1) ව්‍යවස්ථාවලට අනනුකූල වන බවත් ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

එබැවින්, පනත් කෙටුම්පත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 84 ව්‍යවස්ථාවේ (2) අනුව්‍යවස්ථාවේ විධිවිධාන යටතේ විශේෂ බහුතර ඡන්දයකින් සම්මත කොට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 83 ව්‍යවස්ථාවේ නියමිත ප්‍රකාර ජනතාව විසින් ජනමත විචාරණයක දී අනුමත කළ යුතු බව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 123(2) ව්‍යවස්ථාව ප්‍රකාරව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් තීරණය කර ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණයේ තීරණය අද දින කාර්ය සටහන් දැක්වෙන නිල වාර්තාවේ මුද්‍රණය කළ යුතු යැයි මම නියෝග කරමි.